# සද්ධර්මය ලොව පහළ වූ වගයි.

## අමා දොර විවර විය. සැදැහැත්තෝ ශ්‍රද්ධාව මුදා හරිත්වා!

## (අපාරුතා තේසං අමතස්ස ද්වාරා, යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං)

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන් පසුව ප්‍රථම වරට ලෝකය හමුවේ ධර්මදේශනා කිරීම ආරම්භ කළේ අද වැනි ඇසළ පුන් පොහෝ දිනයකයි. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් බඳු අතිදීර්ඝ කාලයක් අපරිමිත පරිත්‍යාග සිදු කොට ගුණ නැණ දියුණු කිරීමේ ප්‍රතිඵල වශයෙන් සම්බුද්ධත්වය සාක්ෂාත් කළ උන් වහන්සේගේ මූලික අභිප්‍රාය වූයේ දුකින් නිදහස් වන මාවත ලොවට පැහැදිලි කිරීමයි. කරුණාව හා ප්‍රඥාව උසස් ම තත්ත්වයට දියුණු කළ බුදුරජාණන් වහන්සේ මහාකරුණාවෙන් හා මහාප්‍රඥාවෙන් යුතුව තමන් වහන්සේ අවබෝධ කළ ජීවන දර්ශනය බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග මහණුන්ට දේශනා කරමින් තමන් වහන්සේ අපේක්ෂා කළ සදහම් මෙහෙවර අද වැනි දිනක ආරම්භ කළහ.

මෙයින් වසර 2605කට පමණ පෙර වෙසක් පුන් පොහෝ දිනෙක සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ දඹදිව බුද්ධගයාවේදී සම්බුද්ධත්වය සාක්ෂාත් කළහ. ඉන්පසු තමන් වහන්සේ අවබෝධ කළ පරම සත්‍යය මෙනෙහි කරමින් ආධ්‍යාත්මික සුවය භුක්ති විඳිමින් ජයශ්‍රී මහා බෝධිය සමීපයෙහි සති කිහිපයක් ගත කළහ. එහිදී උන් වහන්සේ බෙහෙවින් කාලය ගත කළේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරමින් නිරාමිස සුවය වළඳමිනි. මේ අතර තපස්සුභල්ලුක වෙළෙඳ සොයුරන්ගේ මෙන් ම මුචලින්ද නාරජුගේ ද උපස්ථාන ලැබූහ. බුදුරදුන්ට විළඳ හා මීපිඬුවලින් දන් පිරිනැමූ තපස්සභල්ලුක දෙදෙනා බුදුන් දහම් යන දෙරුවන සරණ ගිය ප්‍රථම ද්වේවාචික උපාසකයන් බවට පත්වීමට භාග්‍යය ලැබූයේ ද මෙහි දී ය.

මේ අතර භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළ පටිච්චසමුප්පාද (ඉදප්පච්චතා) සංඛ්‍යාත ගැඹුරු දහම කෙලෙස් බරිත ලොවට දේශනා කිරීමේ දුෂ්කරතාව පිළිබඳව සිහිපත් කළහ.

*'කිච්ඡේන මේ අධිගතං හලංදානි පකාසිතුං,*
*රාගදෝසපරේතෙහි නායං ධම්මෝ සුසම්බුධෝ.*

*පටිසෝතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං,*
*රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධේන ආවටා'ති.* (මහාවග්ගපාළි 1, බු.ජ.ත්‍රි. 10 පිට)

ඒ අනුව තමන් වහන්සේ ඉතා දුෂ්කරව අවබෝධ කළ මේ ගැඹුරු වූ තියුණු වූ අවබෝධ කිරීමට දුෂ්කර වූ පටිසෝතගාමී දහම රාගයෙන් රත් වූ ද්වේෂයෙන් බරිත වූ මෝහාන්ධකාරයෙන් වැසුණු ලෝකයා නොදකින බව උන් වහන්සේට පෙනී ගියේ ය. බුදුරදුන්ගේ මෙම සිතිවිල්ල වහා දැනගත් සහම්පති මහාබ්‍රහ්මයා ධර්මය නොඇසීමෙන් ලෝකයා වැනසෙන බව දැක ධර්මදේශනා කිරීමට ආරාධනා කළහ. ලෝකයා රාගද්වේෂමෝහයෙන් වෙළී සිටිය ද මඳ වශයෙන් රාගාදි කෙලෙස් ඇස් සත්ත්වයන් ධර්මය අවබෝධ කිරීමට සමත් බව සහම්පති බ්‍රහ්මයා සඳහන් කළේ ය. ඒ අනුව භාග්‍යවතුන් වහන්සේ ද කරුණාබර සිතින් යුතුව තමන් වහන්සේගේ ම ඥානයෙන් එය දැක ලොවට ධර්මය දේශනා කිරීමට තීරණය කළහ. උන්වහන්සේට ලොව පෙනී ගියේ විවිධ මට්ටමින් වැඩුණු පියුම් සහිත විලක් ලෙසිනි. පියුම් විල්වල හිරු එළිය දුටු සැණින් විකසිත වන පියුම් මෙන් ම දින සති කිහිපයක් ගතවීමෙන් විකසිත වන පියුම් ද පවතී. එමෙන් ම සත්ත්ව ලෝකය ද වහා ධර්මය අවබෝධ කළ හැකි ප්‍රාඥයන්ගෙන් මෙන් ම කල්ගතවීමෙන් ධර්මාවබෝධ කළ හැකි මන්ද ප්‍රාඥයන්ගෙන් ද යුක්ත වූවකි. මෙලෙස ලෝකය දෙස කරුණා ඇසින් යුතුව බලා වදාළ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනය ආරම්භයට ප්‍රථම විවෘත ප්‍රකාශයක් කරමින් ලෝවැසි සැදැහැවතුන්ට සිය දෙසවන් යොමු කරන ලෙස දන්වා සිටිති.

*'අපාරුතා තෙසං අමතස්ස ද්වාරා යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං,*
*විහිංසසඤ්ඤී පගුණං න භාසයිං ධම්මං පණීතං මනුජේසු බ්‍රහ්මේ'ති*

ලොව දහම් දෙසීමට තීරණය කළ භාග්‍යවතුන් වහන්සේ ඉන්පසුව සලකා බැලූයේ කවරකුට නම් පළමුව ධර්ම දේශනා කළ යුතු ද? කවරකුට ධර්මය දේශනා කළහොත් වහා ධර්මාවබෝධය කරන්නේ ද? යන්නයි. ඒ අනුව උන් වහන්සේට මුලින් ම පෙනී ගියේ බොහෝ කලක් අල්ප කෙලෙස් සහිතව තවුස්දම් පිරූ ව්‍යක්ත, නුවණැති ආලාරකාලාම පිළිබඳවයි. ඒ පිළිබඳව තවදුරටත් විමසා බැලීමේ දී බුදුරදුන්ට පෙනී ගියේ ආලාකරකාලාම දින හතකට කලින් මිය ගිය බවයි. ඔහුගේ මරණය බුදුරදුන් දක්වා ඇත්තේ මහාපිරිහීමක් වශයෙනි. මක් නිසාද යත් ඔහු ධර්මශ්‍රවණය කළා නම් වහා දහම අවබෝධ කර ගන්නා බැවිනි. ඊ ළඟට උන්වහන්සේගේ මතකයට ආවේ බොහෝ කලක් තවුස්දම් පිරූ නුවණැති ව්‍යක්ත උද්දකරාම පුත්ත පිළිබඳවයි. ඔහු පිළිබඳව ද සලකා බැලීමේ දී පෙනී ගියේ ඔහු ද කලින් දින මැදියම් රැයෙහි මියගොස් ඇති බවයි. උද්දකරාමපුත්ත සිටියේ නම් ධර්මශ්‍රවණය කොට වහා ධර්මාවබෝධය කරන බව දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ මරණය ද මහත් පිරිහීමක්, අභාග්‍යයක් සේ සැලකූහ.

ඊළඟට ධර්මය කවරකුට නම් දේශනා කරන්නේදැයි විමසා බැලූ බුදුරදුන්ට පෙනී ගියේ කලක් උන් වහන්සේ සමග මහණදම් පිරූ ප්‍රදන් වීර්ය වැඩූ උන් වහන්සේට කලක් බෙහෙවින් උපස්ථාන කළ උපකාර කළ පස්වග මහණුන් පිළිබඳවයි. පස්වග මහණුන් දැනට කොහි සිටිත්දැයි නුවණින් පිරික්සා බැලූ විට පෙනී ගියේ ඔවුන් බරණැස මිගාදාය ඉසිපතානාරාමයෙහි වැඩ සිටින බවයි. ඒ අනුව පළමුව ඔවුන්ට දම් දෙසීම සඳහා තීරණය කොට ඔවුන් සිටි බරණැස් නුවර වෙත චාරිකාවෙහි වැඩියහ. බරණැස බලා යන අතරමග උපක නම් ආජීවකයා මුණ ගැසුණු අතර බුදුරදුන්ගේ සිරුරෙහි පැහැපත් බව දැක පැහැදුණු ඔහු උන්වහන්සේ කවරෙක්දැයි විමසා සිටියේ ය. මෙහි දී තමන් කවරෙක්ද හඳුන්වා දෙමින් බුදුරජාණන් වහන්සේ සඳහන් කළේ තමන් වහන්සේ සියලු ලෝකය අවබෝධ කොට සියලු ලෝකය අබිබවා තෘෂ්ණාව දුරුකොට සියල්ල තම නුවණින් ම පසක් කර සිටින ගුරුවරයකු නොමැති තැනැත්තකු බවයි. දෙවියන් සහිත ලෝකයෙහි තමාට සමාන පුද්ගලයකු නොමැති බවත් තමන් එක ම සම්මාසම්බුද්ධ බවත් රහත් උතුමකු බවත් මෝහයෙන් අන්ධ වූ ලොවට නිර්වාණය නමැති අමෘතය ලබා දෙනු වස් ධර්ම චක්‍රය දෙසන්නට බරණැසට වැඩම කරන බවයි. තවද තමන් වහන්සේ ආශ්‍රවයන් දිනූ බැවින් 'අනන්තජින' නම් වන බව ද සඳහන් කළහ.

***සබ්බාභිභූ සබ්බවිදූ'හමස්මි, සබ්බේසු ධම්මේසු අනූපලිත්තෝ,***
***සබ්බඤ්ජහෝ තණ්හක්ඛයේ විමුත්තෝ සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං.***

***න මෙ ආචරියෝ අත්‍ථි සදිසෝ මේ න විජ්ජති,***
***සදේවකස්මිං ලෝකස්මිං නත්‍ථි මේ පටිපුග්ගලෝ.***

***අරහං හි අරහා ලෝකේ අහං සත්‍ථා අනුත්තරෝ,***
***ඒකෝ'ම්හි සම්මාසම්බුද්ධෝ සීතිභූතෝ'ස්මි නිබ්බුතෝ.***

***ධම්මචක්කං පවත්තේතුං ගච්ඡාමි කාසිනං පුරං,***
***අන්‍ධභූතස්මිං ලෝකස්මිං ආහඤ්ඡං අමතදුන්‍දුභි'න්ති.***

බුදුරජාණන් වහන්සේ මෙසේ සඳහන් කළ කල්හි 'ඇවැත්නි, එසේත් විය හැකි යැ'යි හිස සැලූ උපක වෙනත් මගකින් වංගහාර ජනපදය බලා ගමන් කළේ ය.

ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ ක්‍රමයෙන් බරණැසි ඉසිපතන බලා වැඩම කොට පස්වග මහණුන් වෙත සමීප වූහ. සම්බුද්ධත්වයට පත් ව බබලන සිරුරින් යුතුව තමන් වෙත පැමිණෙන බුදුරදුන් දුටු පස්වග මහණුන් පළමුව සිතුයේ උන්වහන්සේ ප්‍රත්‍ය බහුලව නිවන් මගින් බැහැරව සිටින තැනැත්තකු වශයෙනි. එබැවින් උපස්ථාන නොකොට ආසනයක් පමණක් දීමට තීරණය කළහ. එසේ වුව ද බුදුරදුන් සමීප වත් ම කලින් සිටි කථිකාවතෙහි සිටීමට නොහැකි වූ පස්වග මහණුන් පෙරමගට ගොස් උන් වහන්සේ පිළිගෙන උපස්ථාන කළහ. එහෙත් ඔවුන් බුදුරදුන්ට ඇමැතුයේ 'ආවුසෝ' (මිත්‍රය) යනුවෙනි. මෙලෙස ආවුසෝවාදයෙන් අමතන කල්හි එසේ නොකරන ලෙසත් තමන් වහන්සේ දැන් සම්මාසම්බුද්ධත්වය සාක්ෂාත් කළ අයකු බවත් නැවත නැවත් තෙවරක් ප්‍රකාශ කිරීමට බුදුරදුන්ට සිදු

විය. මෙහි දී පස්වග මහණුන් ප්‍රශ්න කර සිටියේ දුෂ්කර ක්‍රියා කරන සමයෙහි ඉතා දැඩි වූ පිළිවෙත් පුරා ලබා ගැනීමට නොහැකි වූ ආර්ය ධර්මය මෙලෙස සැප පහසු ජීවිතයක් ගත කිරීමෙන් කෙසේ නම් ලබා ගත්තේ ද යනුවෙනි. එවිට භාග්‍යවතුන් වහන්සේ ප්‍රතිප්‍රශ්න නගමින් 'මහණෙනි, මම මීට කලිනුත් සම්බුද්ධත්වය ලැබුයේ යැයි ඔබට ප්‍රකාශ කර සිටියේ ද' යනුවෙනි. මෙලෙස යළි යළිත් කරුණු සහිතව ප්‍රකාශ කර සිටි කල්හි බුදුරදුන්ගේ සම්බුද්ධත්වය පිළිගැනීමට පස්වග මහණුන්ට සිදු විය. ඉන්පසු ධර්මය ශ්‍රවණය කිරීමට ඔවුහු දෙසවන් යොමු කළහ.

ධර්ම දේශනය ආරම්භ කරමින් මුලදී ම උන්වහන්සේ සඳහන් කළේ ***'ද්වේ'මෙ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා'*** යනුවෙන් පැවිද්දකු විසින් මෙම අන්ත දෙක ඇසුරු නොකළ යුතු බවයි. එනම් ***'යො චා'යං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්‍ථසංහිතෝ, යෝ චා'යං අත්තකිලමථානුයෝයෝ දුක්ඛෝ අනරියෝ අනත්‍ථසංහිතෝ'*** යනුවෙන් දැක්වූ පරිදි හීන ග්‍රාම්‍ය පෘථග්ජන ප්‍රතිපදාවක් වූ කාමයන්හි දැඩිව ඇලීමත් අනාර්ය වූ වෙහෙසට පත් කරලන්නාවූ අත්තකිලමථානුයෝගයත් ය. මෙලෙස අන්ත දෙක බැහැර කොට තමන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ප්‍රඥා ඇස ලබා දෙන නිවීම ලබා දෙන මධ්‍යම ප්‍රතිපදාව චතුරාර්ය සත්‍යාවබෝධය පිණිස නිර්වාණාවබෝධය පිණිස හේතුවන බව දේශනා කළහ. මෙලෙස නුවණැස ලබා දෙන නිවීම ඇති කරලන මධ්‍යම ප්‍රතිපදාව ලෙස බුදුරජාණන් වහන්සේ මෙහිදී දේශනා කරන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම සම්මාසති, සම්මාසමාධි යන අංග අටෙන් යුතු බුද්ධාදි උතුමන් විසින් පනවන ලද ආර්ය මාර්ගයයි.

මෙහි දී ආර්ය අෂ්ටාංගික මාර්ගය ඉදිරිපත් කළ සැණින් ඊළඟට භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කරන්නේ චතුරාර්ය සත්‍යයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කෙතෙක් දුර ඉදිරියට ගමන් කොට ඉන් ප්‍රතිඵල ලබා කෙලෙස් පිරිනිවීමට පත්වනවාද යන්න තීරණය කෙරෙන ප්‍රධාන සාධකය නම් දුකෙහි හටගැනීම හා නැතිවීම පිළිබඳ කෙතෙක් අවබෝධ කර සිටිනවාද යන කරුණයි. එනම් සම්මාදිට්ඨිය උපදවා ගැනීමේ අවශ්‍යතාවයි. එමනිසා උන්වහන්සේ මෙහිදී දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන චතුරාර්ය සත්‍යය කුමක්දැයි පිළිවෙළින් දේශනා කරති.

චතුරාර්ය සත්‍යය දේශනය ආරම්භ කරමින් පළමුව දුක යනු කුමක්දැයි පැහැදිලි කරති. දුක යනු ජාති, ජරා, ව්‍යාධි, මරණ, අප්‍රිය සම්ප්‍රයෝග, ප්‍රිය විප්‍රයෝග, කැමැති දෑ නොලැබීම යන කරුණුයි. මේ කරුණු ඉදිරිපත් කොට ඒ සියල්ලෙහි පදනම වශයෙන් බුදුරදුන් පැහැදිලි කරන්නේ පංචුපාදානස්කන්ධ දුකයි (***සංඛිත්තේන පංචුපාදානක්ඛන්ධා දුක්ඛ***). අප ජීවිතයෙහි අත්විඳින සියලු දුක් සැපයන්හි පදනම නම් අවිද්‍යාපාදකව හටගන්නා පංචුපාදානස්කන්ධයයි. පංචුපාදානස්කන්ධය යනු දුක්ඛ සත්‍යයයි. කිසියම් අත්දැකීමක් ලැබීමේ දී හේතුඵල සිද්ධාන්තය පිළිබඳ සිහිය හා නුවණ නොමැති විට රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන උපාදානස්කන්ධ පංචකය ගොඩනැගෙන අතර එසේ හටගත් පංචුපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාවෙන් එහි සිත බැස ගැනීම නිසා කෙලෙස් හටගෙන දුක ගොඩනැගේ. අවිද්‍යාපාදක තෘෂ්ණාව දුක්ඛ සමුදය සත්‍යයයි. මෙලෙස පංචුපාදානස්කන්ධයේ හටගැනීම ම දුකෙහි හටගැනීම වශයෙන් දක්වා ඇති අතර එලෙස පංචුපාදානස්කන්ධය ගොඩනොනැගෙන සේ තම සිහිය හා නුවණ ඉහළ ම මට්ටමින් පවත්වා ගැනීම, දුකෙහි නිරෝධය (නිවන) වශයෙන් සඳහන් කොට තිබේ. එනම් තෘෂ්ණාව ඉතිරි නැතිව ම නිරුද්ධ කිරීම නම් වූ දුක්ඛ නිරෝධ සත්‍යයයි. දුක නිරෝධ කිරීමේ මාවත වශයෙන් යළිත් බුදුරදුන් මෙහිදී දක්වා ඇත්තේ සම්මාදිට්ඨිය පෙරටු කොටගත් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එනම් දුක්ඛ නිරෝධගාමිනී පටිපදා නම් වූ ආර්ය සත්‍යයයි. මෙම අවබෝධය තමන් වහන්සේ ලබන තුරු තමන් වහන්සේ **'සම්මාසම්බුද්ධ යැ'**යි ලොවට ප්‍රතිඥා නොකළ බවත් එම අවබෝධය ලැබූ පසු දෙවියන් සහිත ලෝකයාට තමන් වහන්සේ නොසෙල්වෙන චේතෝවිමුක්තිය ලබා අර්හත්වය සාක්ෂාත් කොට මේ අන්තිම භවය යැයි ප්‍රතිඥා දුන් බවත් (***අකුප්පා මේ චේතෝවිමුත්ති අයමන්තිමා ජාති නත්‍ථිදානි පුනබ්භවෝ***) වැඩිදුරටත් සඳහන් කළහ.

මෙලෙස චතුරාර්ය සත්‍යය මිශ්‍රිත පටිච්චසමුප්පාදය පදනම් වූ අනුශාසනය කරන කල්හි කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ හටගත් සියල්ල නිරුද්ධ වන බව පිළිබඳ නුවණ සහිත නිකෙලෙස් වූ දහම් ඇස ලැබූ බව සඳහන් වේ. ***'ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරෝධධම්ම'න්ති'.***

බුදුරජාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා ඇස්, හිස්, මස්, ලේ දන් දෙමින් කරන ලද අපරමිත කැපවීමේ අග්‍රඵලය භුක්ති විඳි අවස්ථාව මෙමගින් ප්‍රකට වේ. උන් වහන්සේ මෙබඳු පරිත්‍යාගයක් සිදු කළේ හුදෙක් තමන් වහන්සේට පමණක් ධර්මාවබෝධය කිරීමට නොව තමන් වහන්සේ දුකින් නිදහස් ව අන් සත්ත්වයන් ද සසර කතරින් එතෙරකරලීම මහත් වූ කරුණාධ්‍යාසයෙන් යුක්තවයි. උන් වහන්සේගේ උත්සාහයෙහි ප්‍රතිඵල ලැබෙන මෙම අසිරිමත් මොහොතෙහි බුදුරජාණන් වහන්සේට දැනුණ නිරාමිස ප්‍රීතිය උන්වහන්සේගේ ම වචනවලින් මෙලෙස සඳහන් තිබේ. ***'අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ. අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ'ති.*** එතැන් පටන් කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ 'අඤ්ඤාකොණ්ඩඤ්ඤ' නමින් ප්‍රකට වූහ.

අතිදීර්ඝ කාලයකට පසු ලොවට ඇසුණු මෙම දහම් හඬ ශ්‍රවණය කළ භූමට්ඨක දෙවියන්ගේ පටන් අකණිටා බඹ ලොව දක්වා අපමණ දෙව් බඹහු සාධුකාර දුන් බව සඳහන් වේ. මෙම දේශනය මිනිස් ලොව පස් දෙනෙකු පමණක් ශ්‍රවණය කළ ද එය ශ්‍රවණය කළ දෙව් බඹුන්ගේ ගණන අපමණ ය. මෙම අසිරිමත් අවස්ථාවෙහි දෙව්ලොව සාධු හඬින් නින්නාද විය. සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකගේ ධර්මය ශ්‍රවණය කිරීමෙන් සත්පුරුෂ අපමණ සත්ත්වයෝ ධර්ම ප්‍රීතියෙන් ඉපිලී ගියහ.

කොණ්ඩඤ්ඤා තාපසතුමා ධර්මාවබෝධය ලබා සෝවාන් වීමෙන් පසුව වප්ප, භද්දිය යන දෙදෙනා ද ඉන්පසු මහානාම, අස්සජි යන දෙදෙනා ද ක්‍රමයෙන් ධර්මාවබෝධය ලැබූ බව සඳහන් වේ. ඉන්පසු ***'එථ භික්ඛවෝ'ති ... ස්වාක්ඛාතෝ ධම්මෝ. චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය'*** යනුවෙන් **එව මහණෙනි, සියලු දුක් නිවීම සඳහා ස්වාක්ඛාත වූ දහමෙහි බඹසර හැසිරෙන්න** වශයෙන් කළ ප්‍රකාශයත් සමඟ කොණ්ඩඤ්ඤ ඇතුළු පස් දෙනාම පැවිදි උපසම්පදාව ලැබූහ. ඒ අනුව ගෞතම සම්බුදු සසුනෙහි පැවිදි උපසම්පදාව ලද පළමු පිරිස බවට මෙම පස්වග මහණහු පත්වූහ.

ඉන්පසු මෙම පස්දෙනාට ම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකයේ අනාත්මතාව විස්තර කරමින් ධර්ම දේශනා කළ අතර එය අසා ඔවුහු පස් දෙනා ම රහත් භාවය සාක්ෂාත් කළහ. ගෞතම සම්බුදු සසුනෙහි පළමු රහත් පස්නම වූයේ පංචවග්ගීය භික්ෂූන් වහන්සේ ය.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මෙලෙස ආරම්භ කළ සදහන් සේවාව වසර 45ක් පුරා උපරිම කාලයක් කැප කොට දෙවියන්, බඹුන් සහිත ලෝකය වෙත ලබා දුන්හ. එයින් අපමණ පිරිසක් ධර්මාවබෝධය කොට දුකින් නිදහස් වූහ. ඒ අතර විශේෂයෙන් භික්ෂු පිරිසක් නිර්මාණය කිරීම හේතුවෙන් මේ සම්බුදු සසුන තව බොහෝ කලක් ඉදිරියට පවත්වා ගැනීම සඳහා ස්ථාවර පදනමක් ද ඇති කළහ. බුදුරදුන් පිරිනිවන් පා වසර 2500කට අධික කාලයක් ගත වුව ද ලොව පුරා නිර්මල බුදුදහම ඒ අයුරින් ම පවත්වා ගැනීමට බුදුරදුන් ආරම්භ කළ භික්ෂු ශාසනය මහත් කාර්යභාරයක් සිදු කොට ඇත. බුදුරජාණන් වහන්සේගේ අපරිමිත පරිත්‍යාගයත් මහරහත් උතුමන්ගේ පටන් අතීතයේ වැඩ විසූ සංඝරත්නයේ මහත් කැපවීමත් නිසා වර්තමානයේ වෙසෙන අප වෙත මෙම උතුම් දහම ලැබී තිබේ. එම සේවයට අපට කළ හැකි උසස් ම ප්‍රත්‍යුපකාරය වන්නේ එම දහම ඉතා ඕනෑකමින්, අවධානයෙන් හා නුවණින් ශ්‍රවණය කොට හැකි උපරිම අයුරින් එය තම තමන්ගේ ජීවිතයට සම්බන්ධ කර ගනිමින් අන් අයට ද කරුණාවෙන් එය පහදා දෙමින් මතුපරපුර වෙනුවෙන් ද එය සුරක්ෂිත කොට දායාද කිරීමයි.

බුදුරජාණන් වහන්සේගේ දේශනයෙහි මූලික පදනම වී ඇත්තේ දුකත් දුකින් නිදහස්වීමත් පැහැදිලි කිරීමයි. දුක යනු පංචුපාදානස්කන්ධයේ හටගැනීමයි. එනම් ඇස්, කන්, නාසාදියෙන් රූප,

ශබ්ද, ගන්ධාදි අරමුණු දැන ගැනීමේදී ඒ පිළිබඳ යථා ස්වභාවය ගැන නොදැනුවත්බව හේතුවෙන් බාහිර රූපය කෙරෙහි සිත බැස ගන්නා ස්වභාවයයි. බාහිරින් යමක් දැන ගැනීමේ දී බාහිර සත්ත්වයන්, පුද්ගලයන්, ද්‍රව්‍ය ඇත යන හැඟීමෙන් අවිද්‍යා සහගතව බාහිරට සිත බැස ගත හොත් ජාති, ජරා, මරණාදියෙන් නිදහස්වීමක් නොමැත. එනිසා යමක් දැන ගැනීමේ දී සිදුවන්නේ තමා තුළ ම පවත්වා සඤ්ඤා, වේදනා සක්‍රිය වීම බවට සිහිය හා නුවණ පවත්වා ගැනීමට අප දක්ෂ වුවහොත් බාහිර දේ හඳුනා ගත්ත ද ඒ ඔස්සේ අවිද්‍යා සහගත සිතින් දිව ගොස් එහි මුළාවට ඇලීමට පත්වීම නවතී. දුකින් නිදහස්වීමේ ඒකායන මාවත මෙයයි. මේ පිළිබඳව මුලදී ශ්‍රැතමය ප්‍රඥා වශයෙන් ධර්ම ශ්‍රවණය තුළින් අසා දැන ගැනීම ධර්ම මාර්ගයේ මූලික පියවරයි. ඉන්පසු එලෙස අසා දැන ගත් ලෝක යථාර්ථය නිතර නුවණින් මෙනෙහි කිරීම හෙවත් යෝනිසෝ මනසිකාරය චින්තාමය ප්‍රඥාවයි. ඒ අතර සමථ විදර්ශනා භාවනා වශයෙන් තම දැනුම ස්ථාවර කර ගෙන එය ජීවිතය හා සම්පූර්ණයෙන් බද්ධ කර ගැනීම භාවනාමය ප්‍රඥාවෙන් සිදු වේ. මෙම පියවර තුන ම ක්‍රමානුකූලව සම්පූර්ණ කර ගැනීම ධර්ම මාර්ගයෙහි බෙහෙවින් වැදගත් වේ. ඒ අනුව ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙහි නිතර යෙදෙමින් හැම මොහොතක් පාසා ම තම කය හා සිත පිළිබඳව සිහිය හා නුවණ පවත්වා ගැනීම අවශ්‍ය කෙරේ. ඒ අනුව නිතර සිදුවන පංචස්කන්ධයේ හටගැනීම හා නිරුද්ධ දුටු පමණට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ ප්‍රකට වී දුකින් නිදහස්වීමට අවස්ථාව උදාවේ.

මෙලෙස සම්මාදිට්ඨියෙන් යුතුව හේතුඵල දහම පිළිබඳ මනා අවබෝධයක් සහිතව සතිපට්ඨානයෙහි යෙදුණු පමණට සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම වර්ධනය කර ගනිමින් ධර්ම මාර්ගයෙහි ඉදිරිය බලා පියවර නැඟීමට අවස්ථාව උදාවේ. මෙහි දී එක් අතකින් මෛත්‍රියෙන් දියුණු විය යුතු අතර අනෙක් අතට ප්‍රඥාව දියුණු කර ගැනීම අවශ්‍ය කෙරේ. අප කෙතෙක් දුරට දුකින් නිදහස් ව ආධ්‍යාත්මික සුවයක් කර ගමන් කරනවාද යන්න තීරණය කෙරෙන ප්‍රධාන කරුණු වන්නේ අප කෙතෙක් දුරට මෛත්‍රියෙන් හා ප්‍රඥාවෙන් දියුණු වෙනවා ද යන්නයි. මේ සඳහා කලණ මිතුරු ඇසුරින් චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය මිශ්‍රිත ධර්මය ශ්‍රවණය කරමින් දර්ශන සම්පත්තිය උපදවා ගෙන දිට්ඨි සම්පන්න බව කරා ගමන් කිරීම අවශ්‍ය වේ. 'අප්පමාදේන සම්පාදේථ' යනුවෙන් බුදුරදුන් උපදෙස් දුන් පරිදි ඉහත සඳහන් ධර්මමාර්ගයෙහි අප්‍රමාදීව නියැළෙමින් සනාථන රැකවරණය සලසා ගැනීම නුවණැත්තකුගේ ප්‍රධාන කාර්ය විය යුතු ය. තමා තමාට පහනක් / දිවයිනක් කොට වාසය කරන ලෙසත් ධර්මය / පහනක් දිවයිනක් කොට වෙසෙන ලෙසත් බුදුදහමින් මඟ පෙන්වන්නේ මෙම උතුම් රැකවරණය තමා වෙත උපදවා ගැනීමටයි.

සම්මාදිට්ඨියෙන් යුතුව ධර්ම මාර්ගයේ පිළිවෙත් පිරීමේ ප්‍රතිඵල වශයෙන් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම වර්ධනය වන අතර තම ජීවිතයේ සියලු කටයුතු සම්පාදනය කරනු ලබන්නේ මෙම අංගයන්ට මූලිකත්වය දෙමිනි. ඒ අනුව බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන නිබඳව තම හදවතෙහි පිහිටුවා ගෙන අකුසලයෙන් වැළකෙමින් කුසල් වඩමින් සිත හා කය පිළිබඳව සතිමත්ව කල් ගත කරන අතර එක් අතකින් සමථ අරමුණකින් සිත සමාධිමත් කරමින් අනෙක් අතින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මෙනෙහි කරමින් හැම මොහොතක් ම දහමට අනුව ජීවත් වීමට උත්සාහ කරයි. මෙහි අවසාන ප්‍රතිඵලය ක්‍රමයෙන් දුකින් නිදහස් වෙමින් ආධ්‍යාත්මික දියුණුවෙහි ඉහළට ගමන් කිරීමයි. එනම් නිවන වෙත සමීප වීමයි.

**ඔබ සැමට තෙරුවන් සරණයි!**

**සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !**

**සීල සමාදානය - ලොස් ඇන්ජලීස් බෞද්ධ විහාරය - පැසදිනා**

බු.ව. 2561 ඇසළ පුන් පොහෝදා - ව්‍ය.ව. 2016.07.17 වන ශනි දින